# බුද්ධ ධර්මය

## 10 - ශ්‍රේණිය



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# පිළිතුරු

## 20 හෙළ කලාවන් සුරකිමු

1. ■ ස්තූපය
   ■ බෝධි වෘක්ෂය
   ■ බුද්ධ ප්‍රතිමාවයි.

2. ■ චෛත්‍යය
   ■ වෙහෙර
   ■ සෑය
   ■ දාගැබ
   ■ ථූපය
   ■ චේතිය


3. ■ ථූපාරාම දාගැබයි.
   ■ දකුණු අකු ධාතූන් වහන්සේ
   ■ දෙවන පෑතිස් නිරිඳුන්

4. ස්තූප වර්ග 6 කි. ඒවා නම්
   ■ ඝණ්ටාකාර - ඝණ්ඨාරයක හැඩය (සීනුවක හැඩය)
   ■ ඝටාකාර - කළයක හැඩය
   ■ බුබ්බුලාකාර - දිය බුබුලක හැඩය,
   ■ ධාන්‍යාකාර - ධාන්‍ය ගොඩක හැඩය
   ■ පද්මාකාර - පියුමක හෙවත් නෙළුම් මලක හැඩය
   ■ ආමලකාකාර - නෙල්ලි ගෙඩියක හැඩය.

අන්තර්ගතය සැකසීම :- අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාරධර්ම ශාඛාව
පරිගණක පිටු සැකසීම :- උදාර ජයවික්‍රම, හ/තෙළඹුයාය ක.වි. , හකුරුවෙල.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

5. ස්තූපයක් ඇඳ කොටස් නම්කරන්න.




6. I. චේතියඝර හෙවත් වටදාගෙය

ස්තූපය සඳහා ඉදි වූ වෘත්තාකාර පියස්සක් සහිත ගෘහය චේතියඝර හෝ වටදාගෙය නමින් හැඳින්වෙයි. ස්තූපයේ ආරක්ෂාව හා බැතිමතුන්ගේ ආරක්ෂාව සැලකිල්ලට ගෙන මෙම නිර්මාණය කර ඇත. මෙය කුඩා පරිමාණයේ ඇතැම් ස්තූප සඳහා ඉදිකර තිබූ බවට නිදසුන් අද ද දක්නට ලැබේ.

උදාහරණ -ථූපාරාමය, අම්බස්තලය, ලංකාරාමය,

පොළොන්නරුවේ හා මැදිරිගිරියේ පිහිටි වටදාගෙවල් කලාත්මක බවින් අනූන ය.

II. වාහල්කඩ

ස්තූපවල ගර්භයට සම්බන්ධ සිව් දිසාවට මුහුණලා තනන ලද අලංකාර තොරණ වැනි අංගය වාහල්කඩ හෙවත් ආයක නමින් හැඳින්වේ. වාහල්කඩක දෙපස මල් ලියකම් සහිත ශිලා ස්තම්භ දෙකක් පිහිටා ඇති අතර මැද කොටස සමාන්තර තීරු යොදා හංස රූප, වාමන රූප, ඇත් හිස් හා බොරදම් යොදා අලංකාර කොට ඇත. මිහින්තලේ කණ්ඨක චෛත්‍යයෙහි නැගෙනහිර වාහල්කඩ උසස් කලාත්මක නිර්මාණයකි.

අන්තර්ගතය සැකසීම :- අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාරධර්ම ශාඛාව

පරිගණක පිටු සැකසීම :- උදාර ජයවික්‍රම, හ/තෙළඹුයාය ක.වි. , හකුරුවෙල.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

III. බෝධිඝර

බෝධීන් වහන්සේ වටා නිමවන ලද පටු පියස්සක් සහිත මණ්ඩපය බෝධිඝරය ලෙස හැඳින්වෙයි. බෝධිඝරය තුළින් බෝධි වෘක්ෂයේ ආරක්ෂාව සඳහා ඉදිකර ඇත. අනුරාධපුරයේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ වටා ද, බෝධිඝරයක් නිමවා තිබූ බවට සාක්ෂි හමුවේ. මෙතෙක් හමු වී ඇති කලාත්මක බවින් උසස් ම බෝධිඝරය කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිල්ලක්ගම පිහිටා ඇත.

IV. සඳකඩපහණ

බෞද්ධ සිද්ධස්ථානයකට පිවිසෙන පියගැට පෙළක ආරම්භයේ දක්නට ලැබෙන අර්ධකවාකාර ගල් පුවරුව හැඳින්වෙන්නේ සඳකඩපහණ නමිනි. මෙය ලාංකේය කැටයම්ශිල්පියාගේ විස්මිත කලා කෞශල්‍යය ලොවට හෙළි කරන තවත් සුවිශේෂ නිමැවුමකි. පාලියෙන් "අඩ්ඪචන්දපාසාණ" යනුවෙන් හැඳින්වෙයි. අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා ඒ ඒ යුගවලට අයත් සඳකඩපහණ රැසක් හමු වී ඇති අතර එම නිර්මාණ ඒ ඒ යුගවලට අනන්‍ය ලක්ෂණ ප්‍රකට කරයි. වඩාත් කලාත්මක සඳකඩපහණ නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවන්නේ අනුරාධපුර යුගයේ මධ්‍ය භාගයේ විසූ කලාකරුවන්ට ය. දැනට හමු වී ඇති සඳකඩපහණ කිහිපය අතර කලාත්මක බවින් මුල් තැන ගන්නේ අනුරාධපුරයේ බිසෝ මාලිගය අසල ඇති සඳකඩපහණයි.

මේවායේ කලාත්මක බව තීව්‍ර කරන ප්‍රධාන සාධකය වන්නේ එහි ඇති විසිතුරු කැටයම් ය. මල් ලියකම්වලින් මෙන් ම සත්ත්ව රූපවලින් ද සඳකඩපහණ විසිතුරු වේ. අනුරාධපුර සඳකඩපහණ පිටත සිට ඇතුළත ඇති කැටයම්වල මුලින් ම දක්නට ලැබෙන්නේ ශෛලිගත පලාපෙති මෝස්තරයයි. අනතුරුව ඇත්තේ එකිනෙකා පසුපස දිවයන ඇත්, අස්, සිංහ, ගව යන සතුන් සිව්දෙනායි. ඉන් පසු සංකීර්ණ ලියවැලක් ද අනතුරුව තුඩින් නෙළුම් පොහොට්ටු රැගෙන එකා පසු පස ගමන් කරන හංස පේළියක් ද ඊළඟට නැවත වතාවක් සරල ලියවැලක් ද දක්නට ලැබේ. සඳකඩපහණෙහි මැද ඇත්තේ නෙළුම් මලක අර්ධයකි. මෙම පිළිවෙළ හා කැටයම් සෑම සඳකඩපහණකට ම පොදු නොවේ. පොළොන්නරු යුගයේ සඳකඩපහණෙහි ගව රූපය ඉවත් ව ඇත. එයට හේතුව ලෙස සැලකෙන්නේ මේවන විට හින්දු ආභාසය ලාංකේය සංස්කෘතියට එකතු වීමයි. මහනුවර යුගයේ සඳකඩපහණ කැටයම්වලින් පමණක් නොව හැඩය අතින් ද වෙනස් වී ඇත. අනුරාධපුර යුගයට අයත් සඳකඩපහණින් භව චක්‍රය අර්ථවත් කෙරෙන බව මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා පවසයි.

අන්තර්ගතය සැකසීම :- අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාරධර්ම ශාඛාව

පරිගණක පිටු සැකසීම :- උදාර ජයවික්‍රම, හ/තෙළඹුයාය ක.වි. , හකුරුවෙල.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

V. මුරගල

විහාර මන්දිරයක හෝ රාජකීය ගොඩනැගිල්ලක දොරටු අලංකාර කරන අර්ධ කවාකාර මුදුන සහිත ගල්පුවරු දෙක මුරගල් නමින් හැඳින්වේ. සඳකඩපහණක හෝ පියගැට පෙළක ආරම්භක පියගැටය දෙපස මේ අලංකාර නිමැවුම දැකිය හැකි ය. මේවා කැටයම් සහිත හෝ රහිත හෝ ඒවා වේ. කොරවක්ගලේ ආරක්ෂාව තහවුරු කෙරෙන මුරගලේ විකාශය අනුව ඒවායේ ඇති කැටයම් ද විවිධාකාර ය. මුරගල ආරම්භයේ කැටයම් රහිත වුව ද, පසු ව පුන්කලස, බහිරව රූප හෙවත් වාමන රූප, පෙණය සහිත නාග රූප එයට එක් විය. මෙහි දැකිය හැකි මිනිස් වෙස් ගත් නා රජ කැටයම මුරගල විකාශයේ දියුණු ම අවස්ථාව පෙන්නුම් කරන්නකි. නා රජුගේ හිස වටා විහිදෙන නයි පෙණ මාලාවකි. ත්‍රිභංග ලීලාවෙන් නැගී සිටින නා රජුගේ වැලමිටෙන් ඉහළට නැමුණ එක් අතක ඇත්තේ

මල් පිරවූ පුන් කළසකි. අනෙක් අතේ ඇත්තේ දලුලන ශාඛාවක් හෝ මල් ඉත්තක් වැනි දෙයකි. නා රජුගේ දෙපා මුල වාමන රූප එකක් හෝ දෙකක් දැකිය හැකි ය. දැනට විද්වතුන්ගේ සම්භාවනාවට ලක් වූ කලාත්මක මුරගල හමුවන්නේ අභයගිරියට අයත් රත්නප්‍රාසාදය නමැති ගොඩනැගිල්ල සමීපයෙනි.

7. ■ සීගිරිය

■ හිඳගල

8. ■ මහියංගණ ස්තූපයේ ධාතු ගර්භය,

■ දිඹුලාගල ලෙන්

■ හා තිවංක පිළිමගෙය

9. තිවංක පිළිමගෙය හෙවත් මහ පැරකුම්බා රජු විසින් කරවන ලද ජේතවනාරාමයේ පිළිම ගෙය

10. පූජනීය ස්ථාන ආරක්ෂා කිරීම ලාංකික අප සැමගේ ම යුතුකමකි. එය තනි පුද්ගලයෙකුට හෝ ආයතනයකට පමණක් කළ හැකි කාර්යයක් නොවේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට හා සංස්කෘතික ත්‍රිකෝණ අරමුදලට පමණක් මේවා ආරක්ෂා කිරීම අපහසු ය. අද දවසේ ජීවත් වන අප මේවා ආරක්ෂා කිරීමට නොපෙළඹුණහොත් මතු පරපුරට අතීත උරුමයන් දැක ගැනීමේ අවස්ථාව අහිමි වනවා පමණක් නොව වසර දහස් ගණනක අපේ ප්‍රෞඪ ඉතිහාසය තහවුරු කරන ජීවමාන සාක්ෂි ද අහිමි වේ. ඒ නිසා හැකි සෑම අවස්ථාවක ම මේවා ආරක්ෂා කිරීමට යොමු විය යුතු ය. ඇතැම් විට අපගේ නොසැලකිලිමත්භාවය නිසා ද මේවා විනාශ වන අවස්ථා දැකිය හැකි ය. මේ ස්ථාන වන්දනාමාන කිරීමට හෝ දැක බලා ගැනීමට ගිය විට පැරණි ගඩොල් බැම් මත ඇවිද යාම, එම ස්ථාන කුරුටු ගෑම, පැරණි නිර්මාණ හෝ ගඩොල් මත වාඩි වී සිටීම කිසි සේත් නොකළ යුතු ය. මෙම ස්ථානවල ප්‍රසිද්ධ කොට ඇති උපදෙස් ප්‍රචාරණවලට අනුව ක්‍රියා කිරීමට අප සියලු දෙනා ම යොමු විය යුතු ය. ඒ මගින් පෞරාණික වස්තූන් හා කලාත්මක නිර්මාණ ආරක්ෂා කිරීමේ වගකීම ද අප වෙතින් ඉටු වන්නේ ය.



Copyright © www.e-thaksalawa.moe.gov.lk